**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් මස 20 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 160,396.36 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 148,126.44 ක් උපයෝජනය කර තිබුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 12,269.92 ක් හෙවත් සියයට 7.65 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 151,664.60 | 144,320.61 | 7,344.99 | 4.84 |
| මූලධන | 8,731.76 | 3,805.83 | 4,925.93 | 56.41 |
| **එකතුව** | 160,396.36 | 148,126.44 | 12,269.92 | 7.65 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

(i) ජනාධිපති කාර්යාලය විසින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මඟින් ක්‍රියාත්මක කරන වැ දියවර සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන සහ 2016/2017 මහ කන්නයේ කාබනික පොහොර නිපදවීමේ වැඩසටහන වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 09 ක් හා රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

වැ දියවර සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ වැව් 06 ක ප්‍රතිසංස්කරණය සඳහා වූ ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 3.18 ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 33,498 කින් ඉටුකළයුතු කටයුතු නිමකර තිබුණි. එහිදී වැව් 02 ක ප්‍රතිසංස්කරණ වැඩ අවසන් කර තිබුණු අතර, ඉතිරි වැව් 04 හි භෞතික ප්‍රගති පිළිවෙලින් සියයට 03 සිට සියයට 60 දක්වා විය. අදාල වැඩ ඇස්තමේන්තුව අනුව රු.මිලියන 5.11ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 53,802 කින් ඉටු කළයුතු ප්‍රතිසංස්කරණ කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට නිමකර නොතිබුණි.

(ii) 2016/2017 මහ කන්නයේ කාබනික පොහොර නිපදවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදනය රු. මිලියන 10 ක් වුවත් 2016 දෙසැම්බර් 15 දිනට බැරකම් රු.මිලියන 1.50 ක් වූ අතර, රු.මිලියන 11.05 ක් වියදම් දරා තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල විෂය අංක 22201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2,750.00 | 2,749.59 | 2,700.00 | 2,768.88 | 2,800.00 | 1,481.85 |

## 2.3 අග්‍රිම ගිණුම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ වන අංක 7002/0000/00/0028/0016/000 වූ අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 222.74 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ වන තැන්පත් ගිණුම් පහක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 192.13 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0115/000 | 0.40 |
| 6000/0000/00/0002/0162/000 | 7.18 |
| 6000/0000/00/0013/0115/000 | 146.62 |
| 6000/0000/00/0016/0105/000 | 18.85 |
| 6000/0000/00/0020/0025/000 | 19.08 |
| **එකතුව** | **192.13** |

## 2.5 විගණන නිරීක්ෂණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුමේ හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**පාකිස්ථානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ප්‍රතිපාදන**

පාකිස්ථානු ණය යෝජනා ක්‍රමය යටතේ සංඥා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබාදුන් රු. මිලියන 587.52 කින් රු.මිලියන 0.14 ක් පමණක් වැය කර තිබුණු අතර, ඉතිරිය රු.මිලියන 587.38 විය. යථෝක්ත මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු 2016 වර්ෂය තුල සිදු නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 3.2 අග්‍රිම ගිණුම්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2016 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබුණු අග්‍රිම ශේෂය රු.මිලියන 222.74 ක් වූ අතර, 2017 ජුලි 24 දිනට ඉන් තවදුරටත් නිරවුල් කිරීමට පැවති වටිනාකම රු.මිලියන 32.48 ක් විය.

### 3.3 පොදු තැන්පත් ගිණුම

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලද සරසවි සිසු නායකත්ව පුහුණු වැඩසටහන සඳහා මුදලින් රු.මිලියන 17.22 ක් 2016 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2017 ජුලි 20 දිනට තවදුරටත් නිරවුල් කිරීමට පැවති වටිනාකම රු.මිලියන 0.17 ක් විය.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 22201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම ගිණුම පිළිබඳ විගණනයට ඉදිරිපත් කළ 2016 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 117.70 ක් විය. එම ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක් තුල හිඟව පැවති අතර, 2017 ජූලි 20 දින වනවිට ඉන් තවදුරටත් නිරවුල් වීමට පැවති වටිනාකම රු.මිලියන 68.98 ක් විය.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---

**වත්කම් කළමනාකරණය**

---

**බේරුම් නොකළ බැරකම්**

---

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් වල එකතු වටිනාකම රු. මිලියන 6,176.31 ක් විය.

**3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) නාරාහේන්පිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහල සඳහා Single Plane floor Mounted C - Arms System Dsa උපකරණය රු.මිලියන 66.08 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. මෙම උපකරණය මිලදී ගැනීම සඳහා සකස් කළ ලංසු පිරිවිතරයන්ට අනුව පිවිසුම් 05 ක් තිබිය යුතු බව දක්වා තිබුණු නමුත්, සපයා තිබුණු උපකරණය පිවිසුම් 05 ක් නොමැති බව පසුව හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, යුද්ධ හමුදා රෝහලෙහි විකිරණ රශ්මි අංශය වෙත මෙම උපකරණය 2013 නොවැම්බර් 05 දින ලැබී තිබුණු නමුත් මාස 07 කට පසුව 2014 මැයි 27 දින සිට භාවිතයට ගෙන තිබුණි. එම කාල පරිච්ඡේදය තුළ උක්ත උපකරණය සැපයීම සිදුකල ආයතනය වෙත දන්වා පිවිසුම් 05 ක් සහිත උපකරණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් නව තාක්ෂණයෙන් යුතු වෛද්‍ය උපකරණයක් යුද්ධ හමුදා රෝහල වෙත ලබා ගැනීමේ අවස්ථාව මඟ හැරී තිබුණි. එමෙන්ම 2016 ජූලි මස 07 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී උක්ත උපකරණය ක්‍රියා විරහිත වී තිබුණු බවත්, ඒ වන විට පරීක්ෂාකර තිබුණු රෝගීන් සංඛ්‍යාව 67 දෙනෙක් පමණක් වූ බවත් නිරීක්ෂණය විය.

(ආ) අභිමංසල 01 සුවසහන නිකේතනයේ ඉහල මහලේ වැසිකිළි පද්ධතිය ටයිල් ඇතිරීම සඳහා භාණ්ඩ වර්ග 04 ක් ගබඩාවට ලැබී තිබුණි. 2016 ඔක්තෝම්බර් 20 දින සිදු කළ භෞතික පරීක්ෂාවේ දී අනාවරණය වූයේ අලුතින් ඉදිකළ වැසිකිළි හෝ අළුත් වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින වැසිකිළි කිසිවක් අදාල ගොඩනැගිල්ලේ කිසිදු මහලක නොමැති බවය.

**3.7 අවිධිමත් ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නාරාහේන්පිට රෝහලට රු.මිලියන 8.02 ක වටිනාකමකින් යුත් "ND YAG LASER LONG PULSED" නමැති උපකරණයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි පිරිවිතරයන්ට අනුව සැපයුම් කරුගෙන් වර්ෂ 05

ක වගකීම් කාලයක් ලබා ගත යුතු බව දක්වා ඇතත් තෝරාගත් සැපයුම්කරු ලබා දී තිබුනේ වර්ෂ 02 ක වගකීම් කාලයක් පමණි. තවද සැපයුම් කරු සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව අදාල උපකරණය 2015 ජනවාරි 28 දිනට පෙර සැපයිය යුතු බවට එකඟ වී තිබුණද සැපයීම සිදුකර තිබුණේ 2016 පෙබරවාරි 19 දිනදීය. ගිවිසුමෙහි 8.2 වගන්තිය ප්‍රකාරව අදාල භාණ්ඩ සැපයීම දින තිහකට වඩා ප්‍රමාද කලහොත් කොන්ත්‍රාත්තුව නතර කර කාර්යසාධන බැදුම්කරය රාජසන්තක කරන බව සඳහන්ව තිබුණද, එසේ නොකර භාණඩ සැපයීමේ කාලය වර්ෂයකින් දීර්ඝ කර තිබුණි.

(ආ) මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් (Multimedia Projector) 37 ක්, ලොජික් 6'x6' ට්‍රයිපෝඩ් ස්ක්‍රීන් (Logic 6'x6' Tripod Screen) 37ක් සහ 650 වීඒ යූපීඑස් (650 VA UPS 37) ක් මිලදී ගැනීම් සඳහා සැපයුම් කරුවන් තෝරා ගැනීමට 2016 දෙසැම්බර් 08 දින සිදුකල මිල කැඳවීමට අනුව ආයතන 8 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉන් ආයතන දෙකකින් භාණ්ඩ මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම මිලදී ගැනීම සඳහා තෝරාගෙන තිබුණේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ ආයතනයකි.

(ඇ) එකක් රු.15,100 බැගින් පෞද්ගලික ආයතනයක් විසින් සැපයීමට එකඟ වී තිබුණු පරිගණක මේස 300 ක් පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් එක් මේසයකට රු.250 බැගින් අඩු කර ගෙවීමට එකඟ වී තිබුණි. සැපයුම්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2015 ඔක්තෝම්බර් 05 දින වනවිට සියළුම භාණ්ඩ සපයා අවසන් කලයුතු වුවත්, අවස්ථා තුනකදී සැපයුම් කාලය දීර්ග කර තිබියදීත් 2016 ජනවාරි 05 දින වනවිටත් සපයා තිබුණේ මේස 132 ක් පමණි. තවද ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2015 වර්ෂයේ පරිගණක මේස මිල දී ගැනීම සඳහා රු. මිලියන 3.18 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර මෙම මිලදී ගැනීම සඳහා රු.මිලියන 4.95 ක් වැය කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 12 දින රයිස් ස්ටීමර් 80 ක් රු.මියන 13.80 කට මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

**(i)** මිලදී ගැනීමට බලාපොරොත්තු වූ රයිස් ස්ටීමර් උපකරණයෙහි මූලික පිරිවිතරයේ මූලික අංගයන් වූ ස්වයංක්‍රීය උෂ්ණත්ව පාලකයක් තිබීම හා ධාරිතාව කි. ග්‍රෑ. 36 ක් වීම සපුරා නොතිබුණු අතර, සපයන ලද භාණ්ඩ වල ධාරිතාව කි. ග්‍රෑ 10 ත් 15 ත් අතර පවතී බවත් අනාවරණය විය. පිරිවිතරයන්ට අනුකූල නොවූ මෙම භාණ්ඩ භාර ගැනීම ප්‍රතික්ෂේප කළ හෙයින් පසුව එකක් සඳහා රු.4000 ක වට්ටමක් සහිතව .සැපයීමට එකඟ වී තිබුණු අතර, එමෙන්ම ස්වයංක්‍රීය ස්විචයක් බාහිරව සවිකර දීමටද එකඟ වී තිබුණි.

**(ii)** මිලදී ගත් රයිස් සිටීමර් එකක් අනුරාධපුර ශ්‍රී ලංකා සංඥා බලකායේ 04 වන රෙජිමේන්තුව වෙත 2016 ජනවාරි 16 දින ලබාදී තිබුණු අතර මෙම උපකරණය පාවිච්චි කල නොහැකි තත්ත්වයේ පවතින බව 2016 ඔක්තෝබර් 17 දින සිදු කළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

**3.8 පාඩු හා හානි**

---------------

2016 ජුනි මස 05 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාලාව කඳවුර තුළ පිහිටි අවිගබඩාවේ ඇති වූ පිපිරීමෙන් සිදුවූ අලාභයන් සම්බන්ධව මු.රෙ. 104 (3) යටතේ සිදුකරන ලද පරීක්ෂණයට අනුව ඇස්තමේන්තුගත දළ අලාභය රු. මිලියන 12,735.45 ක් බව ප්‍රාරම්භක වාර්තාව මඟින් හඳුනාගෙන තිබුණි. ආරක්ෂක අමාත්‍යාංශය විසින් මෙම සිදුවීම සම්බන්ධව පරීක්ෂාකර වාර්තා කිරීමට පත් කර

තිබුණු මූලික පරීක්ෂණ උසාවි මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම් කටයුතු 2017 අප්‍රේල් 30 දින වන විටත් සිදුකරමින් පැවති හෙයින් අලාභය නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත් කර නොතිබුණි.

## 3.9 කළමණාකරණ දුර්වලතා

--------------------------

උතුරු ප්‍රදේශය ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවා ගැනීමේ මානුෂික මෙහෙයුමේදී අත්පත් කරගත් වෙල්ලමුල්ලිවයික්කාල් මුහුදු තීරයේ තිබුණු අබලන් තත්ත්වයේ පැවති ෆාරා III නෞකාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් යකඩ වශයෙන් අලෙවි කිරීමට කටයුතු කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 80.30 ක් ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවකු වෙත ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු කපා ඉවත් කරගත් යකඩ වෙනුවෙන් රු.මිලියන 47 ක් ගෙවා තිබුණු අතර ඔහු විසින් කාර්යය අතර මැද නවතා දමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2016 සැප්තැම්බර් 30 දින වන විට නැව විකිණීමෙන් ලැබී තිබුණු රු.මිලියන 47.00 ක මුදලින් රු.මිලියන 15 ක් "අපි වෙනුවෙන් අපි " අරමුදලටද, ඉතිරි රු.මිලියන 32.00 "යුද්ධ හමුදා සුභසාධක අරමුදල " ටද බැරකර තිබුණි. "යුද්ධ හමුදා සුභසාධක අරමුදල" ට බැරකර තිබුණු මුදල විගණනය විසින් පෙන්වාදීමෙන් පසුව රජයේ ආදායමට 2016 නොවැම්බර් 17 දින බැරකර තිබුණි.

**(ආ)** 2014 අගෝස්තු 13 වන දින කොන්ත්‍රාත් ගිවිසුම සඳහා අත්සන්කළ අතිරික්ත පරිෂ්ඨයන් අනුව ඉවත් කර ගන්නා ටෙන්වීල් ලොරි රථ ප්‍රමාණය අනුව ගාස්තු නියම කර තිබුනත් පිළිගත් මිණුම් ඒකකයක් භාවිතා නොකිරීම හේතුවෙන් ගිවිසුම අනුව යකඩ ඉවත් කර ගැනීමේදී අවභාවිතයන්ට ඉඩකඩ සැලසී තිබුණි. ඉතා දුෂ්කර ප්‍රදේශයක් වන අදාල ප්‍රදේශයේ අබලි යකඩ කිරා මැන බැලීමට අවශ්‍ය පහසුකම් නොතිබීම යන ප්‍රායෝගික හේතූන් මත වරකට ගෙනයාහැකි යකඩ ප්‍රමාණය (බර) ගිවිසුමට ඇතුලත් නොකළ බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වත්කම් කළමණාකරන අධ්‍යාක්ෂවරයා විසින් දන්වා තිබුණි.

**(ඇ)** මුහුදුබත් වූ නෞකාවේ ජලය මතුපිට ඇති කොටස් කපා ඉවත් කිරීමට වඩා ජලයට යටවූ කොටස් කපා ඉවත් කිරීම සඳහා ඉහල පිරිවැයක් සහිත තාක්ෂණික ක්‍රම භාවිතා කළ යුතුව පැවතුණි. එමෙන්ම ඒ පිළිබඳව සැළකිල්ලට ගෙන ගිවිසුම් කොන්දේසි ඇතුලත් නොකිරීම හේතුවෙන් පහසුවෙන් කපා ඉවත් කළහැකි කොටස් පමණක් ඉවත් කරගෙන ඉතිරි කොටස් අත්හැර දැමීමට ගැණුම්කරුට හැකි වී තිබුණි. ඉතිරි කොටස් ඉවත් කිරීමට වඩා එලෙසම තැබීමෙන් මත්ස්‍ය සම්පත බෝ වීම තුළින් ආර්ථිකමය වශයෙන් වාසිදායක වන බැවින් නෞකාවේ ඉතිරි කොටස එලෙසම තබා ඇති බවට පසුව කරුණු දක්වා තිබුණි. නමුත් ඒ සඳහා අදාල ආයතන වෙතින් ලබා ගත යුතු පාරසරික වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව දැක්වුවද 2017 සැප්තැම්බර් 20 දින වන විටත් ලබා ගෙන නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ නිලධාරී හා සෙසුනිළ සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | නිළධාරී - නිත්‍ය /ස්වේච්ඡා | 10,646 | 9,412 | 1,234 |
| (ii) | සෙසුනිළ - නිත්‍ය /ස්වේච්ඡා | 189,719 | 167,404 | 22,315 |
| | | **200,365** | **176,816** | **23,549** |

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ සිවිල් කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 09 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 199 | 150 | 49 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6,386 | 9,343 | - | 2,957 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 4,537 | 1,321 | 3,216 | - |
| | එකතුව | **11,141** | **10,826** | **3,272** | **2,957** |